## Trending වෙන සෙල්ලම් සහ වෙනස්කම් රැසක් සමඟින්

## The Voice Sri Lanka යළිත්

කවදත් වෙනස් අත්දැකීම් සමීප කරන සිරස TV තුළින් මේ මස 22 වෙනිදා සිට සති අග රාත්‍රී 8.30ට Voice Sri Lanka හි දෙවැනි අදියරෙහි ආස්වාදය ලාංකීය ප්‍රේක්ෂකයින්ට රසවිඳීමට හැකිවනු ඇත.

“The Voice”.. ප්‍රසිද්ධ නෙදර්ලන්ත ජාතික වැඩසටහන් නිෂ්පාදකයෙකු වන ජෝන් ද මෝල්ගේ සංකල්පයකි. ජාත්‍යන්තරය තුල පෙරළිකාර ගායන තරු රැසක් බිහිකළ “The Voice” සන්නාමය ආශ්‍රයෙන් සිරස TV, The Voice Sri Lanka සහ The Voice Teens Sri Lanka හඳුන්වා දෙන ලදී. එහි තිබූ නැවුම් හා තරඟකාරී බව නිසාම අනෙකුත් සියළු තරඟකාරී රියැලිටි වැඩසටහන් අභිබවමින් අතිමහත් ප්‍රේක්ෂකාදරයක් මෙම වැඩසටහන් ද්විත්වය දිනා ගන්නා ලදී.

නව පරපුරේ මෙන්ම පැරණි පරපුරේ ගීත රැසක් මේ අදියර සඳහා ඉදිරිපත් වන තරඟකරුවන් විසින් ගායනා කරනු ඇත. ප්‍රවීණ ගායන ශිල්පීන් වන භාතිය සන්තුෂ්, ශෂිකා නිසංසලා, කසුන් කල්හාර සහ උමාරියා සිංහවංශ මෙහි පුහුණුකරුවන් ලෙස කටයුතු කරයි. වැඩසටහන මෙහෙය වන්නේ ජනප්‍රිය රංගන ශිල්පී සුමිරාන් ධනංජය ගුණසේකර විසිනි.. Blind Auditions, Battles, Knockouts, Super Knockouts, Live Shows, Quarter Finals, Semi Final සහ Final ලෙසින් මාස හයක් පුරාවට වැඩසටහන් 56ක් The Voice Sri Lanka දෙවනි අදියරේදී දිගහැරෙනු ඇත. පෙර අදියරයන් සේම මෙම අදියරේදීත් සියළුම වැඩසටහන් දකුණු ආසියාවේ විශාලතම මැදිරි සංකීර්ණය වන Stein Studios තුළදී පටිගත කෙරෙන්නේ අසමසම තාක්ෂණයකින් මෙන්ම වෘත්තීමය වශයෙන් දැවැන්ත නිෂ්පාදක කණ්ඩායමකගේ සුසංයෝගයෙනි.

ලාංකීය හඬ ජාත්‍යන්තරය ඉදිරියේ අබිසෙස් ගන්වන රියැලිටි ගමනේ ආශ්චර්ය මග නොහැර විඳගන්න, ඔබත් ඔක්තෝබර් 22 වනදා සිට සෑම සති අන්තයකම රාත්‍රී 8.30 සිට සිරස TV නරඹන්න.